# එකතු කළ අගය මත බදු ( VAT )

| 01. |
|---|

සත්තුෂ්ගේ ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකි. ව්‍යාපාරයේ 2020 ජනවාරි මසට අදාල ණයට ගනුදෙනු පහත දැක්වේ

01 / 02 භාණ්ඩ ණයට ගැනුම්

නාලක ගෙන් රු 160 000 ( ඉ.අ. 120 )

නුවන්ගෙන් රු 220 000 ( ඉ.අ. 85 )

නිමල්ගෙන් රු 180 000 ( ඉ.අ. 112 )

01 / 07 භාණ්ඩ ණයට විකුණුම්

කසුන් ට රු 160 000 ( ඉ. අ. 01 )

කමල් ට රු 180 000 ( ඉ. අ. 02 )

කමනි ට රු 230 000 ( ඉ. අ. 03 )

01 / 09 ආපසු යැවුම්

නුවන් ට රු 15 000 ( හරපත් අංක 01 )

නිමල් ට රු 20 000 ( හරපත් අංක 02 )

01 / 16 මුදල් ලැබීම් - කසුන් ගෙන් රු 100 000 අඩු කල වට්ටම රු 5 000

01 / 17 ආපසු එවුම්

කසුන් රු 30 000 ( බැර පත් අංක 01 )

කමල් රු 8 000 ( බැර පත් අංක 02 )

01 / 19 මුදල් ගෙවීම් - නාලකට රු 70 000 ලද වට්ටම රු 3 000

01 / 20 මුදල් ලැබීම් - කමනි ගෙන් රු 80 000 අඩුකල වට්ටම රු 2 000

ඉහත වටිනාකම් වැට් රහිතව දක්වා ඇත. ( විකුණුම් , ගැනුම් , ආපසු එවුම් , ආපසු යැවුම් ) VAT අනුපාතය 8% ක් ලෙස සලකන්න.

අවශ්‍ය වන්නේ ,

01. ඉහත ගනුදෙනු වලට අදාල ජනවාරි මස සඳහා අවශ්‍ය මූලික සටහන් පොත් පිළියෙල කර දක්වන්න.
02. ඉහත ගනුදෙනු වලට අදාල ජනවාරි මස සඳහා පොදු ලෙජරයේ ගිණුම් පිළියෙ ල කරන්න.

JMC learning "your virtual learning partner" Saranga Sampath

## 02.

මන්සූර් ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකි . ව්‍යාපාරයේ 2020 මාර්තු මසට අදාල ණයට ගනුදෙනු පහත දැක්වේ .

01 / 04 භාණ්ඩ ණයට ගැනුම්

රමීන් ගෙන් රු 432 000 ( ඉ.අ. 450 )

රාසික් ගෙන් රු 270 000 ( ඉ.අ. 152 )

රාමන් ගෙන් රු 113 616 ( ඉ.අ. 45 )

01 / 06 භාණ්ඩ ණයට විකුණුම්

නිෂාන් ට රු 540 000 ( ඉ. අ. 01 )

නිලංක ට රු 372 816 ( ඉ. අ. 02 )

නිල්මිණි ට රු 319 248 ( ඉ. අ. 03 )

01 / 10 ආපසු යැවුම්

නුවන් ට රු 27 216 ( හරපත් අංක 01 )

නිමල් ට රු 48 816 ( හරපත් අංක 02 )

01 / 15 මුදල් ලැබීම් - රමීන් ගෙන් රු 220 000 අඩු කල වට්ටම රු 2 000

01 / 19 ආපසු එවුම්

කසුන් රු 12 528 ( බැර පත් අංක 01 )

කමල් රු 55 728 ( බැර පත් අංක 02 )

01 / 22 මුදල් ගෙවීම් - නිලංක ට රු 120 000 ලද වට්ටම රු 4 000

01 / 27 මුදල් ලැබීම් - නිල්මිණි ගෙන් රු 180 000 අඩුකල වට්ටම රු 6 000

ඉහත වටිනාකම් වැට් ( **VAT** ) සහිතව දක්වා ඇත. ( විකුණුම් , ගැනුම් , ආපසු එවුම් , ආපසු යැවුම් ) VAT අනුපාතය 8% ක් ලෙස සලකන්න.

අවශ්‍ය වන්නේ ,

01. ඉහත ගනුදෙනු වලට අදාල මාර්තු මස සඳහා අවශය මූලික සටහන් පොත් පිළියෙල කර දක්වන්න.
02. ඉහත ගනුදෙනු වලට අදාල මාර්තු මස සඳහා පොදු ලෙජරයේ ගිණුම් පිළියෙ ල කරන්න.

# 03.

පහත සඳහන් එක් එක් අවස්ථාවන් වලදී වැට් අනුපාතය 8% ක් ලෙස සලකන්න.

01. ව්‍යාපාරයක් වර්ෂයක් තුල මිලදී ගත් භාණ්ඩ වල වටිනාකම ලෙස ( වැට් රහිත ) රු. 880 000 ක් දක්වා තිබුණි. එම ගැනුම් මත ලැබිය යුතු වැට් ( **VAT** ) ගණනය කර දක්වන්න.

02. ව්‍යාපාරයක් වර්ෂයක් තුල විකුණු භාණ්ඩ වල වටිනාකම ලෙස ( වැට් රහිත ) රු. 1 200 000 ක් දක්වා තිබුණි. එම විකුණුම් මත ගෙවිය යුතු( **VAT** ) වැට් ගණනය කර දක්වන්න.

03. ව්‍යාපාරයක් වර්ෂයක් තුල මිලදී ගත් භාණ්ඩ වල වටිනාකම ලෙස ( වැට් සහිත ) රු. 756 000 ක් දක්වා තිබුණි. එම ගැනුම් මත ලැබිය යුතු වැට් ( **VAT** ) ගණනය කර දක්වන්න.

04. ව්‍යාපාරයක් වර්ෂයක් තුල විකුණු භාණ්ඩ වල වටිනාකම ලෙස ( වැට් සහිත ) රු. 1 296 000 ක් දක්වා තිබුණි. එම විකුණුම් මත ගෙවිය යුතු වැට් ( **VAT** ) ගණනය කර දක්වන්න

05. වැට් සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක පහත ගනුදෙනු වැට් ( **VAT** ) රහිතව දක්වා ඇත. අදාල තොරතුරු ඇසුරින් වැට් පාලන ගිණුම පිළියෙල කරන්න.

   - වර්ෂය ආරම්භයේ වැට් ( **VAT** ) පාලන ගිණුමේ බැර ශේෂය රු. 6 000 කි.
   - වර්ෂයේ විකුණුම් රු. 1 120 000
   - වර්ෂයේ ගැනුම් රු. 450 000
   - ආපසු එවුම් රු. 60 000

06. වැට් ( **VAT** ) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක පහත ගනුදෙනු වැට් සහිතව දක්වා ඇත. අදාල තොරතුරු ඇසුරින් වැට් පාලන( **VAT** ) ගිණුම පිළියෙල කරන්න.

   - වර්ෂය ආරම්භයේ වැට් පාලන ගිණුමේ හර ශේෂය රු. 2 000 කි.
   - වර්ෂයේ විකුණුම් රු. 1 620 000
   - වර්ෂයේ ගැනුම් රු. 864 000
   - ආපසු එවුම් රු. 86 400
   - ආපසු යැවුම් රු. 64 800

07. වැට් ( **VAT** ) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක පහත ගනුදෙනු වැට් සහිතව දක්වා ඇත. අදාල තොරතුරු ඇසුරින් වැට්( **VAT** ) පාලන ගිණුම පිළියෙල කර , වර්ෂයේ විකුණුම් ගණනය කරන්න

   - වර්ෂය ආරම්භයේ වැට් පාලන ගිණුමේ බැර ශේෂය රු. 8 000 කි.
   - වර්ෂයේ ගැනුම් රු. 799 200
   - ආපසු එවුම් රු. 21 600
   - ආපසු යැවුම් රු. 16 200
   - වර්ෂය තුල මුදලින් ගෙවූ වැට් රු 22 000 ක් වූ අතර වර්ෂය අවසානයේ ගෙවිය යුතු වැට් රු. 10 000 ක් විය.

Sasanga Sampath
JMC Learning "your virtual learning partner"

## 04.

සේපාලිගේ ව්‍යාපාරය වැට් ( **VAT** ) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකි. 2021 මාර්තු 31 දිනට ව්‍යාපාරයේ ශේෂ පිරික්ෂුමෙන් උපුටා ගත් දත්ත කහිපයක් පහත දැක්වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ගැනුම් | 669 600 | |
| 2020.04.01 තොගය | 40 000 | |
| 2020.04.01 දිනට වැට් ( **VAT** ) පාලන ගිණුම | 19 000 | |
| ගෙන ඒම කුලී | 20 000 | |
| විකුණුම් | - | 1 209 600 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 82 000 | - |
| ආපසු එවුම් | 16 416 | - |
| වෙළඳ ගෙවිය යුතු දෑ | - | 352 000 |
| ආපසු යැවුම් | - | 56 376 |
| ගෙවූ වැට් | 15 000 | - |

අතිරේක තොරතුරු

01. වර්ෂයේ ගැනුම් හා විකුණුම් හා ඊට අදාල ගනුදෙනු වැට්( **VAT** ) සහිතව ගිණුම්ගත කර ඇත.

අවශ්‍ය වන්නේ ,

1. 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වැට් ( **VAT** ) සඳහා වූ උදාහරණයන් දක්වන්න.

## 05.

සී/ස සුමිතුරු සමාගමේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද වැට් ( **VAT** ) පාලන ගිණුම පහත දැක්වේ.

වැට් ( **VAT** ) පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| | | ඉ/ගෙ/ ශේෂය | 4 000 |
| ලැබිය යුතු වැට් | 8 000 | ගෙවිය යුතු වැට් | 16 000 |
| මුදල් පාලන | 10 000 | | |
| ප/ගෙ/ශේෂය | 2 000 | | |
| | 20 000 | | 20 000 |

- මෙම සමාගමේ තොගය වර්ෂය තුල රු. 10 000 කින් වැඩි වී ඇත.
- විකුණුම් හා ගැනුම් මත 8% ක් වැට් ( **VAT** ) අයකරයි.

අවශ්‍ය වන්නේ ,

2021.03.31 න් අවසන් වර්ෂය සඳහා සමාගමේ දළ ලාභය ගණනය කර දක්වන්න.

## 06.

සී/ස විල්සන් සමාගමේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද වැට් ( **VAT** ) පාලන ගිණුම පහත දැක්වේ.

වැට් ( **VAT** ) පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| | | ඉ/ගෙ/ ශේෂය | 12 000 |
| ලැබිය යුතු වැට් | 24 000 | ගෙවිය යුතු වැට් | 60 000 |
| මුදල් පාලන | 20 000 | | |
| ප/ගෙ/ශේෂය | 26 000 | | |
| | 72 000 | | 72 000 |

- මෙම සමාගමේ තොගය වර්ෂය තුල රු. 30 000 කින් අඩු වී ඇත.
- විකුණුම් හා ගැනුම් මත 8% ක් වැට් ( **VAT** ) අයකරයි.

අවශ්‍ය වන්නේ ,

2021.03.31 න් අවසන් වර්ෂය සඳහා සමාගමේ දළ ලාභය ගණනය කර දක්වන්න.

## 07.

සී/ස කී ටැග් සමාගමේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ,

ගැනුම් වැට් ( **VAT** ) සහිතව රු. 777 600

ආපසු යැවුම් වැට් ( **VAT** ) රහිතව රු. 30 000

ආපසු එවුම් වැට් ( **VAT** ) සහිතව රු. 54 216

මෙම සමාගමේ වර්ෂය තුල වැට් වගකීම රු. 20 000 කින් වැඩිවිය .

වැට් ( **VAT** ) අනුපාතය 8% ක් නම් ආදායම් ප්‍රකාශයේ හදුනාගත යුතු විකුණුම් වල වටිනාකම ගණනය කරන්න.

## 08.

සී/ස නොයෙල් සමාගමේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ,

විකුණුම් ( **VAT** ) වැට් සහිතව රු. 864 000

ආපසු යැවුම් වැට් ( **VAT** ) සහිතව රු. 27 000

ආපසු එවුම් වැට්( **VAT** ) සහිතව රු. 43 200

මෙම සමාගමේ වර්ෂය තුල වැට් වගකීම රු. 25 000 කින් වැඩිවිය .

වැට් ( **VAT** ) අනුපාතය 8% ක් නම් ආදායම් ප්‍රකාශයේ හදුනාගත යුතු ගැනුම් වල වටිනාකම ගණනය කරන්න.

JMC Learning
"your virtual learning partner"
Suranga Sampath

## 09.

සමරපාල සහෝදරයෝ එකතු කළ අගය මත බදු ( VAT ) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකි. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා VAT පාලන ගිණුමේ සාරාංශය පහත දී ඇත. සියළු ගැනුම් හා විකුණුම් මුදලට සිදුවේ .

| | හර ( 000) | බැර ( 000 ) |
|---|---|---|
| 2020 .04 .01 දිනට ශේෂය | - | 2 500 |
| මුදල් (විකුණුම් මත එකතු කළ ) | - | 9 000 |
| මුදල් ( ගැනුම් මත ගෙවූ ) | 4 500 | - |
| මුදලින් ගෙවූ VAT | 2 000 | - |

ගැනුම් මත ගෙවන ලද සියළු VAT අඩුකළ හැකි යැයි උපකල්පණය කරමින් 2021 .03.31 දිනට VAT වගකීම ගණනය කරන්න.

JMC learning
Suranga Sampath
"your virtual learning partner"